# කොවිඩ් 19 සති පාසල සබරගමුව පළාත

# 9 ශ්‍රේණිය - භූගෝල විද්‍යාව

# ඒකකය 01- ආසියානු ප්‍රදේශය

## ක්‍රියාකාරකම 01

ආසියානු ප්‍රදේශයේ පිහිටීම හඳුනාගැනීම.

## හැඳින්වීම

අනෙකුත් මහද්වීප හා සසඳා බලන කල ආසියානු මහද්වීපය සුවිශේෂී මහද්වීපයක් වේ. මහද්වීප 07 අතුරින් ප්‍රමාණයෙන් විශාලතම මහද්වීපය ආසියාව වන අතර එය නැගෙනහිර අර්ධ ගෝලයටත් , උතුරු අර්ධ ගෝලයටත් , දකුණු අර්ධ ගෝලයට සුළු වශයෙන්ද අයත් වේ.භූගෝලීය වශයෙන් ගත් විට එය ප්‍රධාන වශයෙන් යුරෝපා මහද්වීපය හා සම්බන්දය.

## ක්‍රියාකාරක සඳහා උපදෙස්

- 09 ශ්‍රේණියේ භූගෝල විද්‍යාව පෙළ පොතෙහි පිටු අංක 02 - 03 හොඳින් කියවන්න.පිටු අංක 07 හි ඇති 1.1 සිතියමද හොඳින් අධ්‍යනය කරන්න.
- සිතියම් ලකුණු කිරීම සඳහා පාට පැන්සල් භාවිතා කරන්න. එහිදී සම්මත වර්ණ භාවිතය පිළිබඳ සැලකිලිමත් වන්න.
  - කඳුවැටි - දුඹුරු වර්ණය
  - මුහුදු හා ගංගා - නිල් වර්ණය
  - දූපත් - නිල් වර්ණය හැර ඕනෑම වර්ණයක්
- සිතියම් ලකුණු කිරීමට පෙර ඔබ ළඟ ඇති ලෝක සිතියම් පොතක ලෝකයේ භූ විෂමතාවය හා දේශපාලන සිතියම් හොඳින් අධ්‍යයනය කරන්න.
- පිළිතුර ලිවීමට පෙර අනිවාර්යෙන්ම ප්‍රශ්නය ලියන්න.ප්‍රශ්නය ළඟට අදාළ පිළිතුර ලිවීම වඩාත් සුදුසු වේ.

## ප්‍රශ්නාවලිය:

1. සාපේක්ෂ පිහිටීම යනු කුමක්ද?

2. ආසියනු ප්‍රදේශයේ සාපේක්ෂ පිහිටීම ලියා දක්වන්න.

3. නිරපේක්ෂ පිහිටීම යනු කුමක්ද?

4. ආසියානු ප්‍රදේශයේ නිරපේක්ෂ පිහිටීම ලියා දක්වන්න.

5. ආසියාව හා යුරෝපය එක්ව ගත් කල හැඳින්වෙන නම කුමක්ද?

6. ආසියාව යුරෝපයෙන් හා අප්‍රිකාවෙන් වෙන් කරන සීමාවන් නම් කරන්න.

7. සම්මත වර්ණ භාවිත කරමින් එම සීමාවන් ලෝක අකෘති සිතියමක ලකුණු කරන්න.

8. සීමාවන් වෙන් කරගත් සිතියමෙහි ආසියා මහද්වීපයට අයත් ප්‍රදේශය සේයා කරන්න.

9 . ආසියා මහද්වීපයට අයත් ප්‍රමාණයෙන් කුඩා හා ප්‍රමාණයෙන් විශාල දූපත් වගු ගත කරන්න.

10.එම දූපත් ලෝක අකෘති සිතියමක ලකුණු කර නම් කරන්න.

**පසුවැඩ :**

- ලෝකයේ මහද්වීප හා ඒවායේ විශාලත්වයන් ඇතුලත් කරමින් පත්‍රිකාවක් සකස් කරන්න.

සැකසුම
කේ.එන්.බී.බී.එම්.ජී.අයි.කේ.නිරිඇල්ල
ර / නිවි / ඇලපාත මහා විද්‍යාලය.